# සිංහල අවුරුද්දේ ප්‍රභවය හා අනාගතය (දෙවැනි කොටස)

සිංහල අවුරුද්ද ශක වර්ෂය මත පදනම් වෙයි. කණිෂ්ක රජු දවස ශක වර්ෂය ආරම්භ විණි යැයි අප උපකල්පනය කළහොත් ඒ රජු මහායාන බුදු දහම පිළිගත්තේ ද යන ප්‍රශ්නයට ද මුහුන දීමට සිදුවෙයි. හතරවැනි සංගායානාව සිදුවූයේ කණිෂ්ක රජු දවස බවත් මහායානයට එතුමා ථෙරවාදයට  අශෝක රජු සේ වූ බවත් කියැවෙයි. කෙසේ වෙතත් මහායානය නාගර්ජුන හිමියන්ගෙන් පසුව ඇති වූ බවට සැලකීමට සිදුවෙයි. මහාචාර්ය කළුපහන වැනි උගතුන් නාගර්ජුන හිමියන් මහායානිකයකු නොවේ යැයි කීමට තැත් කළ ද ශූන්‍යතාව ඉදිරිපත්කිරීමෙන් හා නිවන සංසාරයට සාපේක්ෂව ගැනීමෙන් උන්වහන්සේ වෙනත් මගක් ගෙන ඇති බව පැහැදිලි ය. නිවන කිසිවකටවත් සාපේක්ෂව ගත නොහැක්කේ එය සංකල්පයක් නොවන බැවින් ය (එය කීව ද එය, එයක් නො වෙයි. නාම පදයක් ලෙස නිවන යන්න යොදාගත්ත ද නිවන යනුවෙන් දෙයක් හෝ යමක් හෝ නැත.). අඳුර එළියට සාපේක්ෂකව ගත හැක්කේ ප්‍රථමයෙන් ම ඒ දෙකම සංකල්ප වන බැවින් ය. එහෙත් සංකල්පයක් වන සංසාරය සංකල්පයක් නොවන නිවනට සාපේක්ෂව ගැනීමෙන් නාගර්ජුන හිමියන් මූලික වරදක් කර ඇත. නාගර්ජුන හිමියන් කිතු වසින් දෙවැනි සියවසට අයත් යැයි සැලකෙන බැවින් ක්‍රිස්තු වර්ෂ 78 දී සිදු වී යැයි කියැවෙන ශක වර්ෂාරම්භය මහායානයට පෙර සිදු වී ඇති බව පැහැදිලි ය. එබැවින් ශක වර්ෂයේ ආරම්භකයන් කණිෂ්ක රජු වුව ද නොවුව ද ථෙරවාදීන් ලෙස ගැනීමේ බාධාවක් තිබිය නො හැකි ය. එහෙත් ප්‍රශ්නය ශක වර්ෂය කණිෂ්ක රජු ආරම්භ කෙළේ ද යන්න ය.

බොහෝවිට සිදුවීමට ඉඩ ඇත්තේ ශක වර්ෂය ශාතවාහනයන්  විසින් ආරම්භ කිරීම ය. ශාතවාහනයන්ට ද ඇතැම්විට ශක යන්න ද යොදාගෙන ඇති බැවින් මේ අවුල සිදුවන්නට ඇත. ශාතවාහනයන්ට ආන්ද්‍ර යන නම ද යෙදෙයි. ඇතැම් ඉතිහාසඥයන්ට අනුව ආන්ද්‍ර ප්‍රදේශයට ඒ නම යෙදී ඇත්තේ ශාතවාහනයන් හෙවත් ආන්ද්‍රයන් විසින් ඒ ප්‍රදේශය පාලනය කෙරුණු බැවින් ය. තුන්වැනි සියවස පමණ කාලය වන තෙක් ශාතවාහනයන්ගේ ආධිපත්‍යය ඩෙකෑන් ප්‍රදේශයෙහි පැවතිණි. පැරණි යුගයේ ථෙරවාදයේ මධ්‍යස්ථානය වූයේ ලංකාව හා ආන්ද්‍ර ප්‍රදේශය බව පැහැදිලි ය. ලංකාවත් ආන්ද්‍ර ප්‍රදේශයත් අතර විශේෂ සම්බන්ධතා වූ බව ද කියැවෙයි. සිහලට්ඨ කතා මෙන් ම ආන්ද්‍රයේ ලියැවුණු අටුවා ගැන ද අපි දනිමු. ආන්ද්‍ර ප්‍රදේශයෙන් බුදු දහම නැති වී යෑමෙන් පසුව ලංකාව ථෙරවාදයේ එකම මධ්‍යස්ථානය බවට පත්විය.

අප විසින් සොයාබැලිය යුතු කරුණක් නම් ශාතවාහනයන්ට අළුතින් වර්ෂයක් ඇතිකිරීමට වූ අවශ්‍යතාව ය. අවුරුදු 1927කට පෙර සූර්ය ගමනේ යම්කිසි විශේෂිත වූවක් සිදුවිණි ද? එසේත් නැත්නම් ඒ වසර ශාතවාහනයන්ට සුවිශේෂ වූ වසරක් වී ද? පෘථිවියට සාපේක්ෂව සූර්යයාගේ චලිතයෙහි සූර්යයා ඛගෝලයෙහි නිරක්ෂය පසුකරන්නේ මාර්තු 21 වැනි දා ය. සූර්යයා එතැන් සිට පෘථිවියට සාපේක්ෂව ක්‍රාන්ති වලයය දිගේ උතුරට ගොස් ජූනි 21 දා කර්කටක නිවර්තනයට ළඟාවීමෙන් පසුව ආපසු හැරෙයි. කර්කට නිවර්තනය උදේනි නගරයට ආසන්නයෙන් යන බව ද අතීතයෙහි උදේනි නගරය අද ග්‍රිනිච් නගරය මෙන් වැදගත් වූ බව ද අමතක නොකළ යුතු ය. එදා ලෝකයේ මධ්‍යහ්න රේඛාව උදේනි නගරය ඔස්සේ යන රේඛාවක් ලෙස ගැණිනි. ක්‍රිස්තු වර්ෂ 78 දී සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට සංක්‍රමණය වී ඇත්තේ මාර්තු 17 වැනි දාට ආසන්න දිනයක බව අපි දුටුවෙමු. සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට සංක්‍රමණය වන දිනය, එනම් බටහිර තාරකා විද්‍යාවට අනුව සූර්යයා මේෂ රාශියේ ප්‍රථම (විෂුව) ලක්ෂ්‍යය (ෆස්ට් පොයින්ට් ඔෆ් ඒරීස්) සමග සමපාත වන දිනය  වසර කිහිපයක  මාර්තු 21 දින සිදු විය යුතු ය. ශාතවාහනයන් මේ දිනයක්, එසේත් නැත්නම් හරියට ම මේෂ රාශියේ ප්‍රථම ලක්ෂ්‍යය ඛගෝලයේ (සෙලෙස්ටියල් ස්ෆියර්) නිරක්ෂය මත පිහිටි වර්ෂය ශක වර්ෂයේ ආරම්භය ලෙස ගත්තේ ද? මෙහි දී විසඳාගත යුතු තවත් ගැටළුවක් වෙයි. භාරතීය නැකැත් පටන්ගන්නේ අස්විද නැකතින් ය. එහෙත් මේෂ රාශයේ ප්‍රථම ලක්ෂ්‍යය ඇත්තේ රේවති නැකතෙහි ය. මේ වෙනස ශක වර්ෂයේ ආරම්භය තීරණයකිරීමේ දී කිසියම් ආකාරයකට බලපෑවේ ද?

ශාතවාහනයන් මේෂ රාශියේ ප්‍රථම ලක්ෂ්‍යය ඛගෝලයේ නිරක්ෂය මත පිහිටි වසර ශක වර්ෂයේ ආරම්භය ලෙස ගත්තේ නම් ශක වර්ෂය ආරම්භ වන්නට ඇත්තේ ක්‍රිස්තු වර්ෂයෙන් හැත්තෑ අටට පසු වසරක විය යුතු ය. ශාතවාහනයන් එසේ ආරම්භ කළ වර්ෂ ක්‍රමයක් පසුව ශකයන් විසින් ඔවුන්ගේ වර්ෂ ක්‍රමයක් ලෙස හඳුන්වනු ලැබී ද? එසේ කිරීමේදී ශකයන් විසින් ශාතවාහනයන් ක්‍රිස්තු වර්ෂයෙන් හැත්තෑඅටට පසුකලෙක ආරම්ශ කළ වර්ෂ ක්‍රමයක්

© Prof. Nalin De Silva

ඔවුන්ගේ (ශකයන්ගේ) වර්ෂ ක්‍රමයක් ලෙස හැඳින්වීම සඳහා ඉදිරියට ගනු ලැබුවේ ද? අපි එයට පිළිතුරු නො දනිමු. සමහරවිට ඒ ප්‍රශ්නයම වැඩකට නැති ප්‍රශ්නයක් විය හැකි ය. එහෙත් මාර්තු 21 හා 17 අතර පරතරය කුඩාවීම අපට ප්‍රශ්න ඇසීමට අනුබලයක් වෙයි.

ඒ කෙසේ වෙතත් කිවයුත්තේ අද ආසියාවේ අප්‍රියෙල් 14 සංක්‍රාන්තියක් ලෙස සලකමින් අවුරුදු උත්සව පවත්වන්නේ ප්‍රධාන වශයෙන් ම ථෙරවාදී බෞද්ධ රටවල බව ය. දිය ස්නානාය කිරීම මෙන් ම දිය ඉසීම ද මේ රටවල ඒදින හා සම්බන්ධ චාරිත්‍ර වෙයි. ලංකාවේ හෝ ඉන්දියාවේ හෝ හින්දුන්ට අප්‍රියෙල් 14 අළුත් අවුරුද්දක් නො වෙයි. ඉංගිරිසින් මෙරට සිංහල ථෙරවාද බෞද්ධයන්ගේ අවුරුද්ද සිංහල හා හින්දු අළුත් අවුරුද්ද ලෙස නම් කළ ද ඔවුන් ඉන්දියාවේ දී ඒ දිනය හින්දු අළුත් අවුරුද් ද ලෙස නම් නොකෙළේ ඇයි? ඉන්දියාවේ හින්දූන්ට සමස්තයක් ලෙස ගත්කල ඒ අවුරුද්දක් නොවීම එයට හේතුව වෙයි. ඉන්දියාවේ බෙංගාලයේ නම් ඒදිනට අළුත් අවුරුදු උත්සවයක් පැවැත්වෙයි. බෙංගාලය හින්දු වුව ද කාලි වන්දනාව අත්නොහැරි හින්දු සංස්කෘතියට තරමක් පිටින් යන සංස්කෘතියක් ඇති ප්‍රදේශයකි. මා මේ සියල්ලෙන් අදහස්කරන්නේ අළුත් අවුරුද්ද සිංහල බෞද්ධයනට පමණක් සීමාවිය යුතු ය යන්න නො වෙයි. සිංහල කිතුණුවන් මෙන්ම හින්දූන් ද මුස්ලිමුන් ද අවුරුදු උත්සවය පවත්වනු දැකීමට මම කැමැත්තෙමි. එහෙත් එහි දී සිංහලයන්ට ඔවුන්ගේ නිර්මාන අහිමි නොකළ යුතු ය. සිංහල අවුරුද්ද මෙරට ජාතික මහොත්සවය බවට පත්කරගැනීමට හැකිනම් ඒ කළ යුතු ය. එහෙත් අප ඒ සඳහා ඉතිහාසය විකෘති නොකළ යුතු ය.

ඉන්දියාවේ අද හින්දු අළුත් අවුරුද්දක් අප්‍රියෙල් 14 වැනි දා නො පැවැත්වෙයි. සිංහල අළුත් අවුරුද්ද මූලික වශයෙන්ම නැකැත් උත්සවයක් වෙයි. සිංහලයන් දේවානම් පියතිස්ස රජු දවස ද නැකැත්කෙළි පවත්වා ඇත. ඒ පොසොන් පොහෝදා ය. බක් මාසයේ වසන්තය උදාවත් සමග ගහකොළ මලින් බරවන කාලයක අස්වැන්න කපාගැනීමෙන් පසුව තවත් නැකැත්කෙළියක් ඔවුන් පවත්වන්නට ඇත. සිංහලයන් උත්සව පැවැත්වීමට රුසියන් බව අපි දනිමු. පොසොන් පොහෝ දා පැවැත්වූ නැකැත් කෙළිය මහින්දාගමනයෙන් පසුව ශාසනික උත්සවයක් බවට ක්‍රමයෙන් පත්වන්නට ඉඩ ඇත.

බක් මාසයේ පවත්වන ලද උත්සවය, ශක වර්ෂය ආරම්භය ආන්ද්‍ර ප්‍රදේශයෙන් සිංහලයන්ට ලැබීමෙන් අනතුරුව, වඩාත් සංකීර්ණ ස්වරූපයක් ගන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය. ආන්ද්‍ර ප්‍රදේශයෙන් ශක වර්ෂය ලැබෙන්නට ඇත්තේ එදා පැවති ථෙරවාද සම්බන්ධකම් ඔස්සේ සිංහලයන්ට පමණක් නොව මියන්මාරය තායිලන්තය හා කාම්බෝජය ආදී රටවලටත් බව විශ්වාස කළහැක්කේ අද ද ඒ රටවල් සංක්‍රාන්ති උත්සවය අප්‍රියෙල් 14 හෝ ආසන්න දිනයක පැවැත්වීම හේතුකොටගෙන ය. එහෙත් මේ සියල්ලන්ටම වඩා උත්සවශ්‍රීයෙන් සූර්ය සංක්‍රාන්තිය අගයන්නේ සිංහලයන් ය.

නොනගතය යන සංකල්පය මුළුමනින් ම සිංහලයන්ගේ නිර්මානයක් විය යුතු ය. සූර්යයා මීනයෙන් මේෂයට පැමිණියේත් (අගත) නැති නොපැමිණියේත් (අනගත) නැති කාලය නොනගත කාලය වෙයි. පෘථිවියට සාපේක්ෂව සූර්යයයාට අහසේ එක් ලක්ෂ්‍යයක් පසුකර යෑමට ගතවන කාලය හරියට ම පැය දොළහක් හා මිනිත්තු හතළිස් අටකි. එබැවින් අහසෙහි මීන රාශිය හා මේෂ රාශිය වෙන්කරන රේඛාව පසුකර යෑමට සූර්යයාට පැය දොළහක් හා මිනිත්තු හතළිස් අටක් ගතවෙයි. ඉන් පැය හයක් හා මිනිත්තු විසිහතරක් ගිය තැන සූර්යයාගෙන් බාගයක් මීන රාශියෙහි ද අනෙක් බාගය මේෂ රාශියෙහි ද වෙයි. සූර්යයාගෙන් බාගයකට වඩා මේෂ රාශියෙහි පිහිටන්නේ නොනගතයෙහි දෙවැනි හෙවත් අපර බාගයෙහි ය.

නොනගතයෙහි නැකැත් නැත යන්න බොරු කතාවකි. ඕනෑම වෙලාවක අහසෙහි නැකතක් උදාවී ඇත. මේ කියන්නේ සමහරවිට සුභ මුහුර්ති ගැන විය හැකි ය. එහෙත් නොනගතයෙහි අපර භාගයෙහි සුභ මුහුර්ති ඇති බැවින් මෙය ද බොරුවක් වෙයි. අද සිංහලයන්ට කෙසේ වෙතත් පැරණි සිංහලයන්ට විචාර බුද්ධියක් තිබුණු බැවින් පැරැන්නෝ නැකැත් ගැනීමට සූර්යයාගෙන් බාගයකට වඩා මේෂ රාශියට පැමිණෙන තුරු බලා සිටියහ. එය ඥානාවන්ත ක්‍රියාවක් බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. එබැවින් පැරැන්නෝ නොනගතයෙහි අපර භාගයෙහි දී නැකැත්ගත්හ.

© Prof. Nalin De Silva

ශක වර්ෂය පටන්ගත්තේ සිංහලයන් නොවුණ ද , ඒ ශාතවාහනයන්ගේ ක්‍රියාවක් වුව ද, සිංහලයෝ සංක්‍රාන්ති උත්සවයට විවිධ අංග එකතුකළහ. සිංහලයන්ගේ නිර්මානශීලීත්වය පෙන්වන කදිම උළෙලක් වනුයේ සිංහල අවුරුද්ද ය. වෙනත් කිසිම රටක නැති ආකාරයෙන් සිංහලයන් සංක්‍රාන්තිය හා සම්බන්ධ උත්සව පවත්වන්නේ එබැවින් ය.

ශ්‍රී වික්‍රම රාජසිංහ ඇතුළු වඩුග රජුන් අවධියෙහි සිංහල අවුරුදු උත්වය ආරම්භ විණි යැයි මතයක් වෙයි. වඩිගයන් ද අවුරුදු උත්සවය පැවැත්වීම අරුමයක් නො වෙයි. වඩිගයන්ගේ මුල්ගම ආන්ද්‍ර ප්‍රදේශයෙහි විය. ඔවුන් ලංකාවට පැමිණියේ අද තමිල්නාඩුව යැයි කියන ප්‍රදේශයෙන් බව සැබෑ නමුත් ඔවුන් තමිල්නාඩුවට ගොස් ඇත්තේ ආන්ද්‍ර ප්‍රදේශයෙන් ය. වඩිගයන් ද සිංහල අවුරුද්ද ඔවුන් පැවැත්වූ ආකාරයට පැවැත්වීමට ඉගෙන ගත්තේ සිංහලයන්ගෙන් විය යුතු ය.  එයට  හේතුව ආන්ද්‍ර දේශයේ හෝ තමිල් නාඩුවේ හෝ අවුරුදු උත්සවයක් ඒ ආකාරයෙන් නො පැවැත්වීම ය.

අප දකුණු ආසියාව නමින් හැඳින්වෙන ප්‍රදේශයේ ඉතිහාසය වෙනත් අයුරකින් බැලීමට පුරුදුවන්නේ නම් ඉංගිරිසින් ඇතුළු බටහිරයන් මේ කලාපයේ ඉතිහාසය ලිවීමට ගොස් එය අවුල්කර ඇති ආකාරය තේරුම්ගත හැකි ය. මේ කලාපයේ  ප්‍රදේශ අතර තිබූ සම්බන්ධය හේතුකොටගෙන එක් ප්‍රදේශයක ආරම්භ වූවක් ටික කලකින් අනෙක් ප්‍රදේශවලට ද ගලාගියේ ය. සමහර අවස්ථාවල ඒ වෙනත් ප්‍රදේශවල මුල් ප්‍රදේශයේ තිබියාටත් වඩා හොඳින් ඒ ආරම්භ වූ දෑ වර්ධනය විය. එයට හේතුව  ඒ සඳහා අවශ්‍ය චින්තනය ඒ අනෙක් ප්‍රදේශයේ ශක්තිසම්පන්නව තිබීම ය. බුදුසමය හා අවුරුදු උත්සවය සිංහලයන්ට භාරතයේ ප්‍රදේශ දෙකකින් ලැබිණි. එහෙත් ඒ ප්‍රදේශ දෙකට ම වඩා හොඳින් අදත් බුදු සමය හා සංක්‍රාන්ති උත්සවය ඇත්තේ සිංහලයන් අතර ය. අනාගතයේත් ඒ එසේම වනු ඇත.

© Prof. Nalin De Silva